# අධ්‍යාපන අමාත්‍යාංශය

# 7 ශ්‍රේණිය - 2 කොටස

# ප්‍රායෝගික හා තාක්ෂණ කුසලතා










**මෙහෙයවීම -**

තාක්ෂණ ශාඛාව

සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ

එල්. එස්. කේ. වික්‍රමසිංහ මිය.

**සැලසුම් කිරීම සහ සකස් කිරීම -**

කේ. ඒ. ඩී. ප්‍රියානි ජයමැණිකේ මිය.

ගෘහ ආර්ථික විද්‍යා ගුරු උපදේශක

(කැලණිය අධ්‍යාපන කලාපය)

ඩබ්. ඒ. සඳමිණී දිලංකා වික්‍රමආරච්චි මිය.

(බප/කැල එස්. කේ. කේ. සූරිආරච්චි ම.වි.)

# 01 කෘෂිකර්මය

## 1.2 පාසල් වත්ත දර්ශනීය වන පරිදි භූමි අලංකරණය කරමු











දුවේ පුතේ පෙළපොතේ පාඩම් කියවන්න. පහත දක්වා ඇති ක්‍රියාකාරකම්වල යෙදෙන්න. ඔබේ ක්‍රියාකාරකම් ඔබත් සමඟ පෙනී සිටින ඡායාරූපයකින් ගුරුතුමාට / ගුරුතුමියට ඉදිරිපත් කරන්න. ලකුණු ලබා ගන්න. සතුටු වෙන්න. ඔබේ හැකියා හඳුනා ගන්න.

යම් පරිසරයක් දැකුම්කලු ලෙස නිර්මාණය කර පවත්වා ගැනීම, එය දකින සියලු දෙනාගේ ම සිත් සතුටු කරවන්නකි. පාසල් භූමිය ද දර්ශනීය අයුරින් අලංකාර කිරීමට දායක වීම ඔබට මහත් තෘප්තියක් ගෙන දෙන කාර්යයක් වනු ඇත.

නමුත් දැන් පාසල් නිවාඩු නිසා, දුවේ පුතේ මෙහෙම ඉගෙන ගනිමු.

1 ඔබේ නිවසේ සුදුසු ස්ථානයක් තෝරා ගෙන අලංකරණය කර ඔබේ ගුරුතුමාට ඉදිරිපත් කර ලකුණු ලබා ගන්න, පහත තොරතුරුද, අධ්‍යනය කරන්න.

2 භූමි අලංකරණය සඳහා යොදා ගන්නා ප්‍රධාන උපාංග වර්ග දෙක නම් කර උදාහරණ දක්වන්න.

3 භූමි අලංකරණයේ දී ශාකවලින් අපේක්ෂා කෙරෙන කාර්යයන් ලියන්න.











4 භූමි අලංකරණයේ දී ශාක යොදා ගන්නා ආකාර මොනවාද?

5 ඒ එකින් එක සඳහා උදාහරණ දක්වන්න.


6 පින්තූර අලවන්න.

7 ප්‍රධාන භූමි අලංකරණ ක්‍රම දෙක නම් කරන්න. පිංතූර අලවන්න. උදාහරණ සඳහා පින්තූර අලවන්න.

8 භූමියක් අලංකරණ කිරීමේ දී සැලකිය යුතු කරුණු මොනවාද?

9 භූමි අලංකරණ ක්‍රියාවලියෙහි පියවර දක්වන්න.









10 භූමි අලංකරණය සඳහා යොදා ගන්නා උපකරණ මොනවාද?

11 සකස් කරන ලද භූමිය නඩත්තු කිරීමට ඉටුකළ යුතු කාර්යයන් මොනවාද?

# 02 ආහාර ක්ෂේත්‍රය

## 2.2 ආහාර අමුද්‍රව්‍යවල ස්වභාවය වෙනස් කරමු - හැඩ කරමු




















විවිධ වර්ණයෙන්, රසයෙන්, සුවඳින්, විවිධ හැඩයෙන් හා පෝෂණ ගුණයෙන් යුතු ආහාර බෝග ස්වාභාව ධර්මයෙන් අපට ලැබුණු මහඟු දායාදයකි. එසේ ම ආහාර සඳහා භාවිත වන අමුද්‍රව්‍ය විවිධ ස්වභාවවලට වෙනස්කර පරිභෝජනයට ගැනීමට ද අප හුරු වී ඇත.

අමුද්‍රව්‍යවල ස්වභාවය වෙනස් කරමින් ඒවායේ විවිධත්වය වැඩි දියුණු කිරීමෙන් ඇස, නාසය, දිව පිනවන අයුරින් සැකසූ ආහාරයක් භුක්ති විඳීමට හැකියාව ලැබේ.

1 ස්වභාවය වෙනස් කිරීමට ආහාර ද්‍රව්‍ය තෝරා ගැනීමේ දී සැලකිලිමත් විය යුතු කරුණු මොනවාද?

2 ආහාරවල භෞතික ස්වභාව වෙනස් කළ හැකි ආකාර උදාහරණ මඟින් ඉදිරිපත් කරන්න.

3 භෞතික ස්වභාව වෙනස් කිරීමට මුළුතැන්ගෙයි ඇති උපකරණ නම් කරන්න.









## 4 යෝග්‍ය මුළුතැන්ගෙයි ආම්පන්න හා උපකරණ තෝරා ගැනීමේ දී හා භාවිත කිරීමේ දී සැලකිලිමත් විය යුතු කරුණු මොනවාද?

5. පහත සඳහන් අමුද්‍රව්‍ය කිහිපයක් තෝරාගෙන ප්‍රායෝගිකව එම ආහාර විවිධ ස්වභාවයන්ට පත් කරන්න. එහි භෞතික ස්වභාවය වෙනස්වීමේ දී සුවඳ, රසය, වයනය හා පෙනුම පිළිබඳව ඔබගේ අත්දැකීම් අභ්‍යාස පොතේ පහත සඳහන් ආකාරයට සඳහන් කරන්න.

- පලතුරු, ධාන්‍ය, මාෂ බෝග වැනි ඔබට කැමති අමුද්‍රව්‍යයක් මේ සඳහා භාවිත කරන්න.

| වෙනස් කළ ස්වභාවය | රසය | සුවඳ | වයනය | පෙනුම |
|---|---|---|---|---|
| කැබලි බවට පත් කිරීම | | | | |
| යුෂ කිරීම | | | | |
| පිටි කිරීම | | | | |








# 03 ආරම්භක තාක්ෂණවේදය

## 3.2 නළ සකසමු - ජලය සුරකිමු




















එදිනෙදා මිනිස් අවශ්‍යතා සපුරා ගැනීම සඳහා ජලය අත්‍යවශ්‍ය වේ. මේ සඳහා බහුල ව යොදා ගනු ලබනුයේ ළිං ජලය හා පළාත් පාලන ආයතනවලින් බෙදා හරින නළ ජලය යි. මිනිස් පරිභෝජනය සඳහා ගත හැකිවන්නේ පෘථිවියේ අඩංගු මුළු ජල ප්‍රමාණයෙන් 1%කටත් වඩා අඩු ජලය ප්‍රමාණයකි. එය සුරක්ෂිත ව පරිභෝජනය කිරීම අප සැමගේ ම යුතුකම හා වගකීමකි.

1 ජලනළ උපාංග නම් කරන්න.

2 ඒවා කුමන කාර්යයක් සඳහා ප්‍රයෝජනයට ගනියිද? ලියන්න.







3 පෙළ පොත අධ්‍යනය කරමින් තාවකාලික ජල සම්බන්ධතාවයක් සකස් කරන්න. ගුරුතුමාට / ගුරුතුමියට ඉදිරිපත් කරන්න.

4 ඒ සඳහා දළ ඇස්තමේන්තුවක් වැඩිහිටියන්ගේ උදව් ඇතිව සකස් කරන්න.

# 04 ව්‍යාපාර කටයුතු

## 4.2 විවිධ ව්‍යාපාර සංවිධාන හඳුනා ගනිමු














පාරිභෝගික අවශ්‍යතා හා වුවමනා ඉටු කිරීම තුළින් ලාභ ලැබීම සඳහා පුද්ගලයෙකු හෝ පුද්ගල කණ්ඩායමක් ලෙස ඒකරාශී වීම ව්‍යාපාර සංවිධානයක් ලෙස හැඳින්වේ.

1 කුඩා ව්‍යාපාර පවත්වාගෙන යාමට සංවිධානය විය හැකි විවිධ ක්‍රම මොනවාද?

2 තනි පුද්ගල ව්‍යාපාර සංවිධාන ක්‍රමයේ වාසිදායක ලක්ෂණ මොනවාද?

3 තනි පුද්ගල ව්‍යාපාර සංවිධාන ක්‍රමයේ අවාසිදායක ලක්ෂණ මොනවාද?






4 හවුල් ව්‍යාපාරයක් යනු කුමක්ද?

5 හවුල් ව්‍යාපාර සංවිධාන ක්‍රමයේ වාසි මොනවාද?

6 හවුල් ව්‍යාපාර සංවිධාන ක්‍රමයේ අවාසි මොනවාද?

7 කුඩා පෞද්ගලික ලක්ෂණ ලියන්න.

8 කුඩා පෞද්ගලික සමාගම් ව්‍යාපාර ක්‍රමයේ වාසි මොනවාද?

9 කුඩා පෞද්ගලික සමාගම් ව්‍යාපාර ක්‍රමයේ අවාසි මොනවාද?





# 05 රූපණ

## 5.2 සන්නිවේදනය සඳහා ආකර්ෂණීය ලෙස රටා යොදා ගනිමු












පණිවිඩයක් සන්නිවේදනය කිරීම සඳහා රූප මාධ්‍ය වැදගත් කාර්යක් ඉටු කරයි. බොහෝ වචන ගණනකින් තේරුම් කිරීමට අපහසු පණිවිඩයක් හෝ විස්තරයක් වඩාත් පහසුවෙන් තේරුම් කර දීමට රූපයක් හෝ රූප පෙළක් යොදා ගත හැකි ය.

1 සංනිවේදනය පිනිස රූප මාධ්‍ය යොදා ගැනීමේ දී සැලකිල්ලට ගත යුතු කරුණු මොනවාද?

2 ඔබ කැමති අක්ෂරයක් තිරස් සහ සිරස් රේඛා දෙකක් ඔස්සේ විවිධාකාරයෙන් නිර්මාණය කරන්න.

3 නිර්මාණාත්මක වැකියක් ලියන්න. එය ආකාර කිහිපයකට අඳින්න උත්සහ ගන්න. මෙම නිර්මාණ ඉදිරිපත් කර ලකුණු ලබා ගන්න.


ගස් සිටවමු. ගස් සිටවමු.

ගස් සිටවමු. ගස් සිටවමු.

ගස් සිටවමු. ගස් සිටවමු.


A A A A A A

A A A A A













4 දැන්වීමක් සකස් කිරීමේ දී අවධානය යොමු කළ යුතු කරුණු මොනවාද?

5 ඔබ කැමති මාතෘකාවකට අදාළව යම් කිසි පණිවිඩයක් ලබා දීම සඳහා අත් පත්‍රිකාවක් සකස් කරන්න. ගුරුතුමාට / ගුරුතුමියට ඉදිරිපත් කරන්න. ලකුණු ලබා ගන්න.

දුවේ, පුතේ ඔබ කැමති නිර්මාණ එකතුවක් කරන්න. (අවමය පහයි) එය විධිමත්ව හැකි ආකාරයකට ගුරුතුමියට / ගුරුතුමාට ඉදිරිපත් කර ලකුණු ලබා ගන්න.

ගුරුභවතුන්ට උපදෙස් -

- දරුවන් අගය කිරීමට පෙළඹෙන්න.
- දරුවන්ගේ ඇගයීම් වෙනුවෙන්, මෙම පාඩම් ආශ්‍රිතව, නිර්ණායක මත, ඇගයුම් ක්‍රමවේද නිර්මාණය කර ගන්න.
- නිදහස් නිර්මාණවලට සිසු දරුවන් යොමු කර අවස්ථා පහක් ඇගයීමට ලක් කරන්න.

